WWW.OLEVELAPI.COM



[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**11 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2018 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2018 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2018

බුද්ධ ධර්මය I, II
பௌத்தம் I, II
Buddhism I, II

## බුද්ධ ධර්මය II

* **පළමුවැනි** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළු ව, ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
* පළමුවැනි ප්‍රශ්නයට ලකුණු **20** ක් ද තෝරා ගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු **10** බැගින් ද හිමි වේ.

---

**1.** (i) සිදුහත් බෝසතාණන් වහන්සේ බුද්ධත්වයට පත්වීමෙන් පසුව කළ ප්‍රථම උදාන වාක්‍යයට අයත් ගාථාවේ මුල් පද දෙක ලියන්න.

(ii) සුද්ධෝදන රජතුමා විසින් සිදුහත් කුමාරයාට වාසය කිරීමට ඉදිකර දුන් මාලිගා **තුන** නම් කරන්න.

(iii) සතර පෙර නිමිති ලියා දක්වන්න.

(iv) "ලාභෝ අලාභෝ අයසෝ යසෝ ච" යන ගාථාවෙන් කියවෙන ධර්ම කරුණු හඳුන්වන පොදු නාමය ලියන්න.

(v) වණ්ණුපථ ජාතකයෙන් ප්‍රකට වන්නේ සිදුහත් බෝසතාණන් සම්පූර්ණ කළ කිනම් පාරමිතාව ද?

(vi) "ඒහි පස්සිකෝ" යන දහම් ගුණයෙහි අර්ථය ලියන්න.

(vii) පරාභව සූත්‍රයේ දැක්වෙන පුද්ගලයාගේ පිරිහීමට හේතු වන කරුණු **දෙකක්** ලියන්න.

(viii) බුදුදහමේ උගන්වන 'අත්ථි සුඛය' යන්න කෙටියෙන් පහදන්න.

(ix) සේඛියා ධර්මවලට අනුව ආහාර පරිභෝජනයේදී පිළිපැදිය යුතු යහපත් පුරුදු **දෙකක්** ලියන්න.

(x) "ඇත ධූලින් වැසී ගිය ඇත්රජ යැ. මෑත සවණක් ඝණ බුදුරැසින් සැදී ගිය බුදුරජාණෝ යැ..." යන පාඨය ඇතුළත් ධර්ම ග්‍රන්ථය හා එහි කතුවරයා නම් කරන්න.

**2.** (i) බුදුරජාණන් වහන්සේ ස්වාභාවික පරිසරය ආශ්‍රිතව වස් විසූ ස්ථාන **දෙකක්** නම් කරන්න.

(ii) උන්වහන්සේ පරිසරයේ සුන්දරත්වය අගය කළ ආකාරය කෙටියෙන් දක්වන්න.

(iii) පාරිසරික සම්පත් ආරක්ෂා කිරීමෙන් ලැබිය හැකි ප්‍රයෝජන මොනවාදැයි පැහැදිලි කරන්න.

**3.** (i) "තංච කම්මං කතං සාධු" යන ධම්මපද ගාථාව සම්පූර්ණ කර ලියන්න.

(ii) එම ගාථාවේ තේරුම ලියන්න.

(iii) පුද්ගල ජීවිතයේ සාර්ථකත්වයට උපදෙස් සපයන ග්‍රන්ථයක් ලෙස ධම්මපදය ඇගයීමට ලක් කරන්න.

**4.** (i) දස රාජධර්මවලට අයත් කරුණු අතුරෙන් **දෙකක්** ලියන්න.

(ii) ඉහත (i) හි දැක්වූ කරුණුවලින් එක් කරුණක් පැහැදිලි කරන්න.

(iii) "මහජනතාවට යහපත් සේවාවක් සැපයීමට දස රාජධර්ම ඉවහල් වේ." විස්තර කරන්න.

**5.** (i) මහින්දාගමනය සිදු වූ ආකාරය සැකෙවින් දක්වන්න.

(ii) ලක්දිව බුදුසමයේ ව්‍යාප්තියට දෙවනපෑතිස් රජතුමාගෙන් සිදු වූ මෙහෙය අගය කරන්න.

(iii) මහින්දාගමනයෙන් අප ලැබූ දායාද පිළිබඳ විස්තරයක් කරන්න.

[ගයවැනි පිටුව බලන්න

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

**6.** (i) දෙවන ධර්ම සංගායනාව පැවැත්වීමට තුඩුදුන් හේතු සැකෙවින් දක්වන්න.

(ii) එම ධර්ම සංගායනාව පැවැත් වූ ස්ථානය, රාජානුග්‍රහය ලබා දුන් පාලකයා හා සහභාගි වූ භික්ෂූන් ගණන ලියන්න.

(iii) දෙවන ධර්ම සංගායනාවේ ප්‍රතිඵල ගෙනහැර දක්වන්න.

**7.** පහත සඳහන් මාතෘකා අතුරෙන් **දෙකකට** කෙටි සටහන් ලියන්න.

(i) රේරුකානේ චන්ද්‍රවිමල මහනාහිමි

(ii) කල්‍යාණ මිත්තතා

(iii) සද්ධර්ම රත්නාවලිය

(iv) බුදුපිළිමය

* * *

WWW.OLEVELAPI.COM

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

WWW.OLEVELAPI.COM



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

| 11 | S | I, II |
|---|---|---|

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2018 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2018 டிசெம்பர்
**General Certificate of Education (Ord. Level) Examination, December 2018**

බුද්ධ ධර්මය I, II
பௌத்தம் I, II
Buddhism I, II

2018.12.03 / 0830 - 1140

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

## බුද්ධ ධර්මය I

**සැලකිය යුතුයි :**

(i) **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**1.** සිදුහත් කුමාරයාට ශිල්ප ශාස්ත්‍ර ඉගැන්වූ බමුණු පඬිවරයා
(1) කොණ්ඩඤ්ඤ නම් වේ. (2) කාලදේවල නම් වේ.
(3) සර්ව මිත්‍ර නම් වේ. (4) සුදත්ත නම් වේ.

**2.** අංගුලිමාල, ආලවක කතාවලින් ප්‍රකට වන්නේ බුදුරජාණන් වහන්සේ තුළ පැවති
(1) අසරණ සරණ ගුණයයි. (2) පුරිසදම්ම සාරථී ගුණයයි.
(3) යථාවාදී තථාකාරී ගුණයයි. (4) තාදී ගුණයයි.

**3.** සිදුහත් බෝසතාණන් 'කිං කුසලගවේසීව' සිටි අවධියේ පළමුව සත්‍ය සොයා ගියේ
(1) ආළාරකාලාම වෙත ය. (2) කාලදේවල වෙත ය.
(3) භග්ගව වෙත ය. (4) උද්දකරාමපුත්ත වෙත ය.

WWW.OLEVELAPI.COM

**4.** බුදුරජාණන් වහන්සේට වේරඤ්ජාවේදී 'යව' නැමැති කටුක ආහාරය වළඳමින් කල් ගෙවීමට සිදු වූයේ
(1) දහවන වස් කාලයේදී ය. (2) දොළොස්වන වස් කාලයේදී ය.
(3) පසළොස්වන වස් කාලයේදී ය. (4) විසිඑක්වන වස් කාලයේදී ය.

**5.** ගිලානෝපස්ථානය බුද්ධ චරිතයෙන් ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවූ අවස්ථාවකට නිදසුනක් වන්නේ
(1) මට්ටකුණ්ඩලී කථා පුවත ය. (2) රජ්ජුමාලා කථා පුවත ය.
(3) සෝපාක කථා පුවත ය. (4) පූතිගත්තතිස්ස කථා පුවත ය.

**6.** සිදුහත් කුමාරයා සරණපාවාගත් භද්දකච්චානා කුමරියගේ පියතුමා වූයේ
(1) උදේන රජතුමා ය. (2) කෝලිය රජතුමා ය. (3) සුප්පබුද්ධ රජතුමා ය. (4) බිම්බිසාර රජතුමා ය.

**7.** "දානං සීලං ච නෙක්ඛම්මං" යන ගාථාවෙන් විස්තර වන්නේ
(1) දස පාරමිතා පිළිබඳව ය. (2) දස රාජධර්ම පිළිබඳව ය.
(3) දස සක්විතිවත් පිළිබඳව ය. (4) දස පින් කිරියවත් පිළිබඳව ය.

[දෙවැනි පිටුව බලන්න

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

**8.** සම්මා සම්බුද්ධ, පච්චේක බුද්ධ, අරහන්ත බුද්ධ යන තුන් ආකාරයට සත්‍ය අවබෝධ කරන බව ධර්මයේ දැක්වේ. එම තුන් ආකාරය
(1) තුන්තරා බෝධිය නම් වේ. (2) ත්‍රිවිධ චෛත්‍ය නම් වේ.
(3) ත්‍රිවිධ රත්නය නම් වේ. (4) ත්‍රිශික්ෂා නම් වේ.

**9.** දාන පරමත්ථ පාරමිතා යනුවෙන් හැඳින්වෙන්නේ
(1) තමා සතු භෞතික දෑ දන්දීමයි. (2) ශරීර අවයව දන්දීමයි.
(3) අඹු දරුවන් දන්දීමයි. (4) තම ජීවිතය දන්දීමයි.

**10.** යමක් ආරම්භ කිරීමේදී, ඉදිරිපත්වීමේදී හා නිරතවීමේදී නොපසුබස්නා උත්සාහයෙන් කටයුතු කිරීමේ වටිනාකම විස්තර වන්නේ
(1) සත්‍ය පාරමිතාවෙනි. (2) නෙක්ඛම්ම පාරමිතාවෙනි.
(3) අධිෂ්ඨාන පාරමිතාවෙනි. (4) වීර්ය පාරමිතාවෙනි.

**11.** නිවන් පසක් කිරීමට අවශ්‍ය මනා වූ පිළිවෙත් රකිනා බැවින් මහා සංඝරත්නය
(1) සුපටිපන්න නම් වේ. (2) උජුපටිපන්න නම් වේ.
(3) ආහුනෙය්‍ය නම් වේ. (4) පාහුනෙය්‍ය නම් වේ.

**12.** සතර සංග්‍රහ වස්තුවට අයත් **නොවන** කරුණ වන්නේ
(1) දානය යන්නයි. (2) සීලය යන්නයි.
(3) ප්‍රිය වචනය යන්නයි. (4) සමානාත්මතාව යන්නයි.

**13.** පංචස්කන්ධය හෙවත් නාම රූප හේතු කොට ගෙන ෂඩායතන (ආයතන හය) ඇති වන බව හේතුඵල ධර්මයෙහි සඳහන් වේ. එම ආයතන හය
(1) රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ, උපධි නම් වේ.
(2) රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ, ධර්ම නම් වේ.
(3) පඨවි, ආපෝ, තේජෝ, වායෝ, ආකාස, ඉන්ද්‍රිය නම් වේ.
(4) චක්ඛු, සෝත, ඝාන, ජිව්හා, කාය, මන නම් වේ.

**14.** භද්දාලි සූත්‍රයෙහි දැක්වෙන පරිදි ආහාරයෙහි ප්‍රමාණය දැන අනුභව කිරීමෙන් ලැබෙන යහපත් ප්‍රතිඵලයක් **නොවන්නේ**
(1) රෝගාබාධ අඩුවීමයි. (2) සුවපහසු පැවැත්මයි.
(3) කාය බලය ලැබීමයි. (4) මානසික බලය ලැබීමයි.

**15.** "කුසලාකුසල කර්ම රැස්කිරීම හේතු කොට ගෙන ප්‍රතිසන්ධි සිත පහළ වේ." යන්න සඳහන් අනුලෝම පටිච්ච සමුප්පාද ඉගැන්වීම වන්නේ
(1) "අවිජ්ජා පච්චයා සංඛාරා" යන්නයි. (2) "සංඛාර පච්චයා විඤ්ඤාණං" යන්නයි.
(3) "විඤ්ඤාණ පච්චයා නාමරූපං" යන්නයි. (4) "උපාදාන පච්චයා භවෝ" යන්නයි.

**16.** "තමාට අහිත වූ අයහපත් දේ කිරීම ඉතා පහසු ය. වැඩදායක යහපත් දේ කිරීම අපහසු ය." යන අදහස ඇතුළත් ධම්මපද ගාථාවේ මුල් දෙපදය දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) "යෝචේ වස්සසතං ජීවේ - දුස්සීලෝ අසමාහිතෝ"
(2) "නතං කම්මං කතං සාධු - යං කත්වා අනුතප්පති"
(3) "සුකරානි අසාධූනි - අත්තනෝ අහිතානිච"
(4) "අත්තනාව කතං පාපං - අත්තනා සංකිලිස්සති"

**17.** උපතිස්ස පිරිවැජියා ඇසූ ප්‍රශ්නයට පිළිතුර ලෙස "යේ ධම්මා හේතුප්පභවා - තේසං හේතුං තථාගතෝ ආහ" යනාදී ගාථාව ප්‍රකාශ කළේ
(1) කොණ්ඩඤ්ඤ හිමි ය. (2) භද්දිය හිමි ය.
(3) මහානාම හිමි ය. (4) අස්සජි හිමි ය.

**18.** බුදුදහමේ දැක්වෙන පරිදි යමක් ඇතිවීමට තවත් දෙයක් හෝ දේවල් කිහිපයක් බලපායි. මෙම අදහස ප්‍රකට වන බෞද්ධ සංකල්පය වන්නේ
(1) පටිච්චසමුප්පාදයයි. (2) අහේතු අප්පච්චයවාදයයි.
(3) අකිරියවාදයයි. (4) පුබ්බේකත හේතුවාදයයි.

[තුන්වැනි පිටුව බලන්න

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

19. යම් සේ ගසක මුල ශක්තිමත්ව නොගැලවී පවතින්නේ ද ඒතාක් කල් එම ගස නැවත නැවත ලියලන්නා සේ පුද්ගලයා ද නැවත නැවත සසර දුකට පත්වන්නේ
(1) වෛරය හේතු කොට ගෙන ය. (2) තණ්හාව හේතු කොට ගෙන ය.
(3) මානය හේතු කොට ගෙන ය. (4) ථීනමිද්ධය හේතු කොට ගෙන ය.

20. ත්‍රිශික්ෂාවේ සමාධි ශික්ෂාවට අයත් **නොවන** මාර්ග අංගය වන්නේ
(1) සම්මා ආජීව යන්නයි. (2) සම්මා වායාම යන්නයි.
(3) සම්මා සති යන්නයි. (4) සම්මා සමාධි යන්නයි.

21. ලොව නොවෙනස් වන කිසිදු පදාර්ථයක් නැති බව අවබෝධ කර ගැනීම පිණිස ඉවහල් වන බෞද්ධ භාවනා ක්‍රමය වන්නේ
(1) ආනාපානසති භාවනාවයි. (2) මෛත්‍රී භාවනාවයි.
(3) සමථ භාවනාවයි. (4) විදර්ශනා භාවනාවයි.

22. තමාට හැකියාව තිබියදීත් මහලුවියට පත් මව්පියන්ට නොසැලකීමේ ආදීනව දැක්වෙන සූත්‍ර දේශනාව
(1) මංගල සූත්‍රයයි. (2) පරාභව සූත්‍රයයි.
(3) සිගාලෝවාද සූත්‍රයයි. (4) පත්තකම්ම සූත්‍රයයි.

23. සිගාලෝවාද සූත්‍රයේ දැක්වෙන පරිදි දෙමාපියන් විසින් දූ දරුවන්ට ඉටුකළ යුතු යුතුකම් අතරට අයත් **නොවන්නේ**
(1) ඔවුන් වරදින් මුදවා ගැනීමයි. (2) ඔවුන් යහපත් කටයුතුවල යෙදවීමයි.
(3) සුදුසු කල්හි සම්පත් පවරාදීමයි. (4) නිවසෙහි වගකීම් පැවරීමයි.

24. "කවරෙක් සත්‍ය කියන්නේ ද කවරෙක් අසත්‍ය කියන්නේදැයි සැකය, විමතිය මතු කිරීම සුදුසු ය. සුදුසු තැන්හි ම ඔබ තුළ සැක ඉපදී තිබේ." යන ප්‍රකාශය තුළින් කියැවෙන්නේ
(1) සිතීමේ හා විමසීමේ නිදහස පිළිබඳව ය. (2) මහණ බමුණන්ගේ ස්වභාවය පිළිබඳව ය.
(3) සත්‍ය හා අසත්‍ය ප්‍රකාශ පිළිබඳව ය. (4) ආගමික සහනශීලීතාව පිළිබඳව ය.

25. උත්සාහයෙන්, දැත දෙපයේ මහන්සියෙන්, දැහැමි හෙළා ධාර්මික රැකියාවක නිරතවීම ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ දැක්වෙන්නේ
(1) උට්ඨාන සම්පදා නමිනි. (2) ආරක්ඛ සම්පදා නමිනි.
(3) කල්‍යාණ මිත්තතා නමිනි. (4) සමජීවිකතා නමිනි.

26. මරණින් මතු පළමු ආත්මභාවයේදී හෙවත් ඊළඟ භවයේදී විපාක දෙන කර්ම
(1) දිට්ඨධම්මවේදනීය කර්ම නම් වේ. (2) උපපජ්ජවේදනීය කර්ම නම් වේ.
(3) අපරාපරියවේදනීය කර්ම නම් වේ. (4) අහෝසි කර්ම නම් වේ.

27. ජනක කර්මයට බාධා පමුණුවන, එහි බලය හීන කරවන කර්මය
(1) කටත්තා කර්ම නම් වේ. (2) උපත්ථම්භක කර්ම නම් වේ.
(3) උපපීඩක කර්ම නම් වේ. (4) උපඝාතක කර්ම නම් වේ.

28. තිදොරින් සිදු කරන අකුසල කර්ම අතර කාය කර්ම ගණයට අයත් **නොවන** කරුණ වන්නේ
(1) ප්‍රාණඝාත යන්නයි. (2) අදත්තාදාන යන්නයි.
(3) කාමමිථ්‍යාචාර යන්නයි. (4) අභිධ්‍යා යන්නයි.

WWW.OLEVELAPI.COM

29. පළමුවන ධර්ම සංගායනාවේ මූලිකත්වය ගෙන ක්‍රියා කළේ
(1) සබ්බකාමී තෙරණුවෝ ය. (2) මොග්ගලී පුත්ත තිස්ස තෙරණුවෝ ය.
(3) මහා කාශ්‍යප තෙරණුවෝ ය. (4) පාර්ශ්ව තෙරණුවෝ ය.

30. "බුදුන් සරණ යෙමියි බුත්සරණ යායුතු" යනුවෙන් සෑම ඡේදයක් අවසානයේ දක්වමින් බුදුගුණ වර්ණනා කරමින් 'අමාවතුර' නම් ග්‍රන්ථය රචනා කළ කතුවරයා
(1) ගුරුළුගෝමී පඬිතුමා ය. (2) විද්‍යා චක්‍රවර්තී පඬිතුමා ය.
(3) බුද්ධපුත්‍ර හිමි ය. (4) ධර්මසේන හිමි ය.

31. බුද්ධ ප්‍රතිමා නිර්මාණය හා වන්දනය ජනප්‍රියවීමත් සමග ප්‍රතිමාවල ආරක්ෂාව සඳහා ගෘහයක් ඉදි වූ අතර එය
(1) චේතියඝර නමින් හැඳින්වේ. (2) පධානඝර නමින් හැඳින්වේ.
(3) පටිමාඝර නමින් හැඳින්වේ. (4) බෝධිඝර නමින් හැඳින්වේ.

[හතරවැනි පිටුව බලන්න

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

**32.** පාලකයෙකු යුක්තිය හා සාධාරණත්වය ඉටු නොවන ලෙස ස්ව කැමැත්ත මත අගතිගාමීව කටයුතු කිරීම

(1) ඡන්දය ලෙස හැඳින්වේ. (2) ද්වේෂය ලෙස හැඳින්වේ.

(3) භය ලෙස හැඳින්වේ. (4) මෝහය ලෙස හැඳින්වේ.

**33.** තමා උපමා කොට අනුන් ගැන සිතන්නට උගන්වන ධම්ම පරියාය බුදුදහමේ හැඳින්වෙන්නේ

(1) ලෝකාධිපති ධම්ම ලෙස ය. (2) අත්තාධිපති ධම්ම ලෙස ය.

(3) ධම්මාධිපති ධම්ම ලෙස ය. (4) අත්තූපනායික ධම්ම ලෙස ය.

**34.** ගර්භයේ හැඩය කළයක ස්වරූපයෙන් ගොඩනංවන ලද ස්තූප හැඳින්වෙන්නේ

(1) ධාන්‍යාකාර ස්තූප ලෙසයි. (2) ඝණ්ඨාකාර ස්තූප ලෙසයි.

(3) ඝටාකාර ස්තූප ලෙසයි. (4) පද්මාකාර ස්තූප ලෙසයි.

**35.** තෙවැනි ධර්ම සංගායනාවේ ප්‍රතිඵල ගණයට අයත් **නොවන්නේ**

(1) දුසිල් මහණුන් සසුනින් නෙරපීම ය.

(2) නවරට සසුන් පිහිටුවීම ය.

(3) අභිධර්ම පිටකයට කථාවත්ථුප්‍රකරණය එක්වීම ය.

(4) ධර්ම විනය රැකගෙන යාමට භාණක පරපුරකට පැවරීම ය.

**36.** එවකට පිරිහී තිබූ ආගම දහම හා බෞද්ධ අධ්‍යාපනය නගා සිටුවීමේ අරමුණින් දේශ හිතෛෂී පිරිස් සමග එක් වී පරම විඥානාර්ථ බෞද්ධ සමාගම පිහිටුවනු ලැබුවේ

(1) හික්කඩුවේ සුමංගල හිමියන් විසිනි. (2) මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමියන් විසිනි.

(3) හෙන්රි ස්ටීල් ඕල්කට්තුමන් විසිනි. (4) අනගාරික ධර්මපාලතුමන් විසිනි.

**37.** වැලිවිට සිරි සරණංකර සංඝරාජ මාහිමිපාණන් වහන්සේ විසින් රචිත ග්‍රන්ථ අතරට ඇතුළත් **නොවන** ග්‍රන්ථය වන්නේ

(1) මුනිගුණාලංකාරයයි. (2) බුදුගුණාලංකාරයයි.

(3) සාරාර්ථ සංග්‍රහයයි. (4) සතර බණවර සන්නයයි.

**38.** දුටුගැමුණු මහරජතුමන් විසින් ඉදිකරනු ලැබූ ආගමික ගොඩනැගිලි පමණක් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) ලෝවාමහාපාය, රුවන්වැලිසෑය, අභයගිරිය

(2) රුවන්වැලිසෑය, මිරිසවැටිය, ජේතවනය

(3) මිරිසවැටිය, රුවන්වැලිසෑය, ලෝවාමහාපාය

(4) රුවන්වැලිසෑය, ථූපාරාමය, මිරිසවැටිය

**39.** මහනුවර රාජධානි යුගයට අයත් සිතුවම් දක්නට ලැබෙන ස්ථානය වන්නේ

(1) හිඳගල විහාරයයි. (2) ගල් විහාරයයි.

(3) තිවංක පිළිමගෙයයි. (4) මැදවල විහාරයයි.

**40.** බුදුරජාණන් වහන්සේගේ දකුණු අකු ධාතුව තැන්පත් කොට දෙවනපෑතිස් රජතුමා ගොඩනැගූ ස්තූපය වන්නේ

(1) මහියංගන චෛත්‍යයයි. (2) ථූපාරාම දාගැබයි.

(3) ගිරිහඬු සෑයයි. (4) රත්කොත් වෙහෙරයි.

WWW.OLEVELAPI.COM

* *

[පස්වැනි පිටුව බලන්න

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

රහස්‍යයි

අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2018
க.பொ.த (சா.தர)ப் பரீட்சை - 2018

| විෂයය අංකය<br>பாட இலக்கம் | 11 | විෂයය<br>பாடம் | බුද්ධ ධර්මය |
|---|---|---|---|

## I පත්‍රය - පිළිතුරු
## I பத்திரம் - விடைகள்

| ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 3 | 11. | 1 | 21. | 4 | 31. | 3 |
| 02. | 2 | 12. | 2 | 22. | 2 | 32. | 1 |
| 03. | 1/3 | 13. | 4 | 23. | 4 | 33. | 4 |
| 04. | 2 | 14. | 4 | 24. | 1 | 34. | 3 |
| 05. | 4 | 15. | 2 | 25. | 1 | 35. | 4 |
| 06. | 3 | 16. | 3 | 26. | 2 | 36. | 3 |
| 07. | 1 | 17. | 4 | 27. | 3 | 37. | 2 |
| 08. | 1 | 18. | 1 | 28. | 4 | 38. | 3 |
| 09. | 4 | 19. | 2 | 29. | 3 | 39. | 4 |
| 10. | 4 | 20. | 1 | 30. | 2 | 40. | 2 |

විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் } එක් පිළිතුරකට ලකුණු / ஒரு சரியான விடைக்கு **01** බැගින් / புள்ளி வீதம்

මුළු ලකුණු / மொத்தப் புள்ளிகள் **01 × 40 = 40**

---

පහත නිදසුනෙහි දැක්වෙන පරිදි බහුවරණ උත්තර පත්‍රයේ අවසාන තීරුවේ ලකුණු ඇතුළත් කරන්න.
கீழ் குறிப்பிடப்பட்டிருக்கும் உதாரணத்திற்கு அமைய பல்தேர்வு வினாக்களுக்குரிய புள்ளிகளை பல்தேர்வு வினாப்பத்திரத்தின் இறுதியில் பதிக.

PAST PAPERS WIKI

නිවැරදි පිළිතුරු සංඛ්‍යාව / சரியான விடைகளின் தொகை: 25 / 40

I පත්‍රයේ මුළු ලකුණු / பத்திரம் I இன் மொத்தப்புள்ளி: 25 / 40

## II පත්‍රය - පිළිතුරු

1. (i) සිදුහත් බෝසතාණන් වහන්සේ බුද්ධත්වයට පත්වීමෙන් පසුව කළ ප්‍රථම උදාන වාක්‍යයට අයත් ගාථාවේ මුල් පද දෙක ලියන්න.
   (ii) සුද්ධෝදන රජතුමා විසින් සිදුහත් කුමාරයාට වාසය කිරීමට ඉදිකර දුන් මාලිගා තුන නම් කරන්න.
   (iii) සතර පෙර නිමිති ලියා දක්වන්න.
   (iv) "ලාභෝ අලාභෝ අයසෝ යසෝ ච" යන ගාථාවෙන් කියවෙන ධර්ම කරුණු හඳුන්වන පොදු නාමය ලියන්න.
   (v) වණ්ණුපථ ජාතකයෙන් ප්‍රකට වන්නේ සිදුහත් බෝසතාණන් සම්පූර්ණ කළ කිනම් පාරමිතාව ද?
   (vi) "ඒහි පස්සිකෝ" යන දහම් ගුණයෙහි අර්ථය ලියන්න.
   (vii) පරාභව සූත්‍රයේ දැක්වෙන පුද්ගලයාගේ පිරිහීමට හේතු වන කරුණු **දෙකක්** ලියන්න.
   (viii) බුදුදහමේ උගන්වන 'අත්ථි සුඛය' යන්න කෙටියෙන් පහදන්න.
   (ix) සේඛියා ධර්මවලට අනුව ආහාර පරිභෝජනයේදී පිළිපැදිය යුතු යහපත් පුරුදු **දෙකක්** ලියන්න.
   (x) "ඇත ධූලින් වැසී ගිය ඇත්රජ යැ. මෑත සවණක් ඝණ බුදුරැසින් සැදී ගිය බුදුරජාණෝ යැ..." යන පාඨය ඇතුළත් ධර්ම ග්‍රන්ථය හා එහි කතුවරයා නම් කරන්න.

i. "අනේක ජාති සංසාරං - සන්ධාවිස්සං අනිබ්බිසං" *(ලකුණු 02 යි)*

ii රම්‍ය, සුරම්‍ය, සුභ *(ලකුණු 02 යි)*

iii. මහල්ලෙක්, ලෙඩෙක්, මළමිනියෙක් හා පැවිදි රුවක් *(ලකුණු 02 යි)*

iv. අටලෝ දහම/ අෂ්ට ලෝක ධර්මය *(ලකුණු 02 යි)*

v. වීර්ය පාරමිතාව/ වීරිය පාරමිතාව/ වීරිය පාරමී/ වීරිය පාරමිතා *(ලකුණු 02 යි)*

vi. එව බලව/ එන්න බලන්න/ පැමිණ බලන්න/ දහමෙහි ඇති විවෘත බව *(ලකුණු 02 යි)*

vii.
ධර්මයට අකමැති වීම
අසත්පුරුෂයන් ප්‍රිය වීම
සත්පුරුෂයන් ප්‍රිය නොකිරීම
අසත්පුරුෂ ධර්මයට ප්‍රිය කිරීම
නිතර නිදන සුලුබව (නිද්දාසීලී)
කතාවෙන්ම දවස ගෙවීම (සභාසීලී)
උත්සාහයෙන් තොරවීම
අලසකම
ක්‍රෝධ කරන බව
මහලුවියට පත් දෙමාපියන්ට නොසැලකීම
මහණ බමුණන් බොරුවෙන් රැවටීම
රස බොජුන් තනිව වැළඳීම
මානයෙන් උදම් වී ඥාතීන් පහත් කොට සැලකීම
ස්ත්‍රීන් කෙරෙහි ලොල්වීම
සුරාව කෙරෙහි ලොල්වීම
සූදු කෙළියෙහි ලොල්වීම
වෛශ්‍යාවන් සේවනය කිරීම
පරඹුවන් කරා යාම
වයසක මිනිසෙකු ළාබාල තරුණියක සරණ පාවා ගැනීම
නාස්තිකාර ස්ත්‍රියක හෝ පුරුෂයකු ගෘහ ආධිපත්‍යයෙහි තැබීම
ධනයෙන් හීන, තෘෂ්ණාවෙන් යුතු ක්ෂත්‍රියයකු රජකම පැතීම

*(ලකුණු 02 යි)*

PAST PAPERS WIKI

viii. අත්ථි සුඛය යනු ධාර්මිකව උපයා සපයා ගත් ධනයක් තමන්ට ඇතැයි සතිමෙන් ඇතිවන සතුටයි.

*(ලකුණු 02 යි)*

ix. ආහාර ළං කිරීමට කලින් මුඛය විවෘත නො කිරීම
ආහාර ගන්නා විට අත මුඛයට ඇතුළු නොකිරීම
ආහාර මුඛයෙහි තබාගෙන කථා නොකිරීම
මුඛය විවෘත කොට ඒ තුළට ආහාර වීසි නොකිරීම
බත් පිඩ කටින් කඩා අනුභව නොකිරීම
අත ගසා දමමින් ආහාර නොගැනීම
දිව මුවින් පිටතට ඇද ආහාර නොගැනීම
සුරු සුරු හඬ නගමින් ආහාර නොගැනීම
අත ලෙවකමින් ආහාර නොගැනීම
පාත්‍රය/ පිඟාන ලෙවකමින් ආහාර නොගැනීම
තොල් ලෙවකමින් ආහාර නොගැනීම
ඉඳුල් සහිත අතින් පැන් බඳුන නොගැනීම
වඳුරන් මෙන් හක්කේ තබාගෙන ආහාර අනුභව නොකිරීම

*(ලකුණු 02 යි)*

x. බුත්සරණ - විද්‍යා චක්‍රවර්ති පඬිවරයා

*(ලකුණු 02 යි)*

*එක් කොටසකට ලකුණු දෙක බැගින් ලකුණු 20 යි.*

2. (i) බුදුරජාණන් වහන්සේ ස්වාභාවික පරිසරය ආශ්‍රිතව වස් විසූ ස්ථාන දෙකක් නම් කරන්න.
(ii) උන්වහන්සේ පරිසරයේ සුන්දරත්වය අගය කළ ආකාරය කෙටියෙන් දක්වන්න.
(iii) පාරිසරික සම්පත් ආරක්ෂා කිරීමෙන් ලැබිය හැකි ප්‍රයෝජන මොනවාදැයි පැහැදිලි කරන්න.

| | | | |
|---|---|---|---|
| i | පළමුවන වස් කාලය | - | බරණැස ඉසිපතනාරාමය |
| | දෙවන, තෙවන හා සිව්වන වස්කාල | - | වේළුවනාරාමය |
| | පස්වන වස් කාලය | - | විශාලා මහනුවර කූටාගාර ශාලාව |
| | හයවන වස් කාලය | - | මකුල පර්වතය |
| | අටවන වස් කාලය | - | භේෂකලා පර්වතය/ භේෂකලා පර්වතය |
| | දහවන වස් කාලය | - | පාරිලෙය්‍ය වනය |
| | දහතුන, දහ අට, දහනවය වස් කාල | - | චාලිය පර්වතය |

*(ලකුණු 02 යි)*

PAST PAPERS WIKI

ii. බුදුරජාණන් වහන්සේ පරිසරයේ සුන්දරත්වය විරාගීව වර්ණනා කොට ඇත.

– රජගහනුවර හා ඒ අවට පරිසරය වර්ණනා කොට ඇත.

රජගහනුවර සිත් අලවන සුලුය. නිග්‍රෝධය සිත්කලුය. චෞර ප්‍රපාතය සිත්කලුය. වේභාර පර්වතය පාර්ශ්වයෙහි වූ සප්තපර්ණී ගුහාව ද සිත්කලුය. ඉසිගිලි පර්වතයේ කාලශිලාව ද සිත්කලුය.................................

– විශාලා මහනුවර උදේන,ගෝතමක, සත්තම්බක සාරන්දද ආදී රමණීය ස්ථාන රැසක් ද වර්ණනා කොට ඇත.

– උරුවෙල් දනව්ව සේනානි නම් නියම් ගමද වර්ණනාවට ලක් කර ඇත.
මේ භූමි භාගය රමණීය ය. වන ලැහැබ ප්‍රිය ජනකය....................

***පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු ප්‍රදානය කරන්න. කරුණු තුනක්වත් දක්වා තිබිය යුතුය.***

***(ලකුණු 03 යි)***

iii.

* අප අවට ඇති පරිසරයේ සියලුම සම්පත් මිනිසාගේ යහපත පිණිසම හේතුවේ.

* බුදු දහම පාරිසරික සම්පත් ආරක්ෂා කර ගැනීම සඳහා වටිනා උපදෙස් රාශියක් ලබාදෙන අතර, එයින් අපට ලබාගත හැකි ප්‍රයෝජන ද පෙන්වා දී ඇත.

* ජල සම්පත ආරක්ෂා කිරීම පිළිබඳව බුදුදහම ප්‍රමුඛතාවක් දක්වයි. ජලයට මුත්‍රා කිරීම, කෙළ ගැසීම වරදක් බවත්, එය භික්ෂූන් වහන්සේලා නොකළ යුත්තක් බවත් පෙන්වා දී ඇත. පිරිසිදු පානීය ජලය ලබා ගැනීමෙන් නිරෝගී ජීවිතයක් ගත කළ හැකිය.

* පිරිසිදු වාතය ද පාරිසරික සම්පතකි. පිරිසිදු පරිසරයක් පවත්වා ගන්නා ආකාරය චුල්ලවග්ග පාළියේ වත්තක්ඛන්ධකයෙහි විස්තර කොට ඇත.

* සත්ත්වයාට ප්‍රධාන වශයෙන් ආහාර ලබා දෙන්නේ තුරුලතාය. වෘක්ෂ ලතා සංරක්ෂණය සම්බන්ධයෙන් බුදු දහමෙහි උපදෙස් ලබා දී ඇත. බුදුරජාණන් වහන්සේ විසින් වනාන්තර වැවීම දිවා රෑ පිං වැඩෙන පිංකමක් ලෙස ද දේශනා කොට ඇත.

* බෞද්ධ උපදෙස් පිළිපදිමින් පාරිසරික සම්පත් ආරක්ෂා කරන්නේ නම් වර්තමානයේ අපට මුහුණදීමට සිදුව ඇති ගංවතුර, නායයාම්, ශ්වසන ආබාධ ආදී පීඩාවන්ගෙන් මිදී සුව පහසු ජීවිතයක් ගත කිරීමට හැකි වනු ඇත.

***පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු විනිශ්චය කරන්න***

***(ලකුණු 05 යි)***

PAST PAPERS WIKI

3. (i) "තංච කම්මං කතං සාධු" යන ධම්මපද ගාථාව සම්පූර්ණ කර ලියන්න.
(ii) එම ගාථාවේ තේරුම ලියන්න.
(iii) පුද්ගල ජීවිතයේ සාර්ථකත්වයට උපදෙස් සපයන ග්‍රන්ථයක් ලෙස ධම්මපදය ඇගයීමට ලක් කරන්න.

i. තංච කම්මං කතං සාධු
යං කත්වා නානුතප්පති
යස්ස පතීතෝ සුමනෝ
විපාකං පටිසේවති

**ගාථාව සම්පූර්ණයෙන් ලියා ඇත්නම් ලකුණු 02 ප්‍රදානය කරන්න.**
**අක්ෂර වින්‍යාසය නොසලකන්න.**

*(ලකුණු 02 යි)*

ii. යමක් කිරීමෙන් පසුතැවීමට සිදු නොවේද, යමක විපාකය ප්‍රීතියෙන් හා සොම්නසින් යුතුව විඳිය හැකි වේද එබඳු ක්‍රියාවල නිරත විය යුතුය.

හෝ

සිහිකරන විට පසු තැවීමට හේතු නොවන, සතුට දනවන ක්‍රියාවන්හි නිරත විය යුතුය

**ගාථාවේ සම්පූර්ණ අදහස තිබේනම් ලකුණු 03 දෙන්න.**

(ලකුණු 03 යි)

iii * පුද්ගල ජීවිතය සාර්ථකත්වයට පත් කර ගැනීම සඳහා උපදෙස් සපයන, ප්‍රායෝගිකව අදාළ කර ගත හැකි මා හැඟි ග්‍රන්ථයක් ලෙස ධම්මපදය සඳහන් කළ හැකිය.

* ධම්මපදයේ එන ගාථා ධර්මයන්හි ඇතුළත් උපදෙස් මගින් හොඳ නරක හඳුනා ගැනීමට මඟ පෙන්වයි.

* සිතේ සන්සුන් බව ඇති කර ගැනීම හා වීර්යවන්තව ක්‍රියා කොට ජීවිතය ජය ගැනීමට උපදෙස් ලබා දෙයි.

* සහජීවනයෙන් ක්‍රියා කිරීමට අල්පේච්ඡ බව ඇති කර ගැනීමට චාම් ජීවිතයක් ගත කිරීමට ඉතා වටිනා උපදෙස් ලබා දෙයි.

* අධික ආශාවන්ගෙන්, අපේක්ෂාවන්ගෙන් තොරව ධනය උපයාගෙන සාර්ථක මිනිසෙකු වීමට උපදෙස් ලබා දෙයි.

* සමාජගත ජීවිතයේදී ඇසුරු කළ යුතු හා නොකළ යුතු පුද්ගලයන් හඳුනා ගැනීමට මඟ පෙන්වයි.

* පුද්ගල පෞරුෂය නිවැරදි ක්‍රියාකාරකම්වලින් ගොඩ නගා ගැනීමට ඉතා වටිනා උපදෙස් ලබා දෙයි.

* සමස්තයක් ලෙස ධම්මපදයෙන් මෙලොව ජීවිතය සාර්ථක කර ගැනීමට මෙන්ම පරලොව ජීවිතය සාර්ථක කර ගැනීමට අවශ්‍ය උපදෙස් ලබා දෙන බව සඳහන් කර තිබීම අවශ්‍ය වේ.

**පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු ප්‍රදානය කරන්න.**

(ලකුණු 05 යි)

PAST PAPERS WIKI

4. (i) දස රාජධර්මවලට අයත් කරුණු අතුරෙන් දෙකක් ලියන්න.
(ii) ඉහත (i) හි දැක්වූ කරුණුවලින් එක් කරුණක් පැහැදිලි කරන්න.
(iii) "මහජනතාවට යහපත් සේවාවක් සැපයීමට දස රාජධර්ම ඉවහල් වේ." විස්තර කරන්න.

i.

1. දානය (දානං)
2. සීලය (සීලං)
3. පරිත්‍යාගය (පරිච්චාගං)
4. ඍජුබව (අජ්ජවං)
5. මෘදු බව (මද්දවං)
6. තපස (තපං)
7. අක්‍රෝධය ( අක්කෝධෝ)
8. අවිහිංසාව (අවිහිංසා)
9. ඉවසීම (ඛන්ති)
10. අවිරෝධතාව/ විරුද්ධ නොවීම (අවිරෝධතා)

***නිවැරදි කරුණු 02 ක් නම් කර තිබේ නම් ලකුණු 02 ක් ලබා දෙන්න.***

***(ලකුණු 02 යි)***

ii. (1) දානය

රටවැසියාගේ ආරථික සුරක්ෂිතතාව තහවුරු කරලීම සඳහා අවශ්‍ය ප්‍රාග්ධනය ලබාදීම දානය යන්නෙන් අර්ථවත් කෙරේ. කෘෂි කර්මාන්තය, වෙළෙඳාම ආදී ජීවන වෘත්තීන් ආරම්භ කොට ක්‍රියාත්මක කර ගෙන යාමට අවශ්‍ය පහසුකම් සපයා දීමයි.

(2) සීලය

කායික,වාචසික සංවරයෙන් යුක්තවීම, සදාචාර සම්පන්න අයෙකු වීම, ප්‍රතිපත්තිගරුක වීම හා අන් අයට ආදර්ශවත් වීම සීලය යි. චාරිත්‍ර වාරිත්‍ර ගැන සැලකිලිමත්ව ක්‍රියා කිරීම මූලික වශයෙන් සීලයට අයත් වේ.

(3) පරිත්‍යාගය

පාලකයා තම රටවැසියාගේ යහපත සඳහා තම කාලය, ශ්‍රමය, ධනය සුව පහසුව යනාදිය කැප කිරීම පරිත්‍යාගයයි.

(4) ඍජු බව

නිවැරදි තීන්දු තීරණ ගැනීමට බාධාවන දේශපාලන හිතවත්කම් ඥාති සබඳතා පසෙක තබා සතර අගතියෙන් තොරව යුක්තිය හා සාධාරණත්වය වෙනුවෙන් අවශ්‍ය කටයුතු කිරීම

PAST PAPERS WIKI

(5) මෘදු බව

මෘදු බව යනු හදවතේ මොලොක් බවයි. ජනතාවට මුහුණපෑමට සිදුවන විවිධ ආර්ථික හා සාමාජික ගැටලු හා අභියෝගවලට කාරුණික හැඟීමෙන් ක්‍රියා කිරීමයි

(6) තපස

මනා ඉන්ද්‍රිය සංවරයක් හා තැන්පත් සිතකින් ජනතා අපේක්ෂා ඉටුවන පරිදි ක්‍රියා කිරීමයි

(7) අක්‍රෝධය

ක්‍රෝධ චේතනාවෙන් තොරව කටයුතු කිරීමයි. සියලු රටවැසියන් තම දරුවන් ලෙස සිතා වෛරයෙන්, ක්‍රෝධයෙන්, කෝපයෙන් තොරව ක්‍රියා කිරීමයි.

(8) අවිහිංසාව

කායික හා මානසික හිංසාවෙන් තොරව මිනිසා ඇතුළු සෑම සත්ත්ව කොට්ඨාසයක් කෙරෙහි ම කටයුතු කිරීමයි.

(9) ඉවසීම

දුරදිග සිතාබලා, ක්ෂණික තීරණවලට නොඑළඹ ඉවසිලිවන්තව කටයුතු කිරීමයි.

(10) අවිරෝධතා

විවිධ අදහස් හා මතවාද දරන පිරිස් සමග මධ්‍යස්ථව ගැටුම්වලින් තොරව කටයුතු කිරීම.

***එක් කරුණක් කෙටියෙන් පැහැදිලි කර තිබේ නම් ලකුණු 03 දෙන්න.***

*(ලකුණු 03 යි)*

iii.

ජනතා හිතවාදී පාලකයෙකු විසින් අනුගමනය කළ යුතු මූලධර්ම අතරට දස රාජ ධර්ම අයත්වේ. ජනතාව හා පාලකයන් අතර පැවැතිය යුත්තේ පිය පුතු සබඳතාවට සමාන ලෙන්ගතු සබඳතාවකි. ඒ සඳහා දස රාජ ධර්ම පිටුබලයක් සපයයි.

* දානය යනු ආර්ථික වශයෙන් රට වැසියන් සුරක්ෂිත කිරීමට කටයුතු කිරීමයි. ඒ තුළින් සමාජය ස්වයංපෝෂිත වෙයි.
* පාලකයා පරිත්‍යාගශීලී වීම නිසා ජනතා සුභ සාධනය දියුණු කළ හැකි වෙයි.

PAST PAPERS WIKI

* පාලකයා සිල්වත් වීම, ඉන්ද්‍රිය සංවරයෙන්, අක්‍රෝධයෙන්, අවිහිංසාවෙන් ක්‍රියා කිරීම නිසා බියෙන්, සැකෙන් තොරව සහජීවනයෙන් හා සාමකාමීව ජීවත්වීමේ හැකියාව ලැබීම.
* ඍජුව ක්‍රියා කිරීම ඉවසීම හා මෘදු බව හේතු කොට ගෙන ජනහිතකාමී තීරණ ගැනීමේ හැකියාව ලැබේ. ඒ තරහා යුක්තිය හා සාධාරණත්වය රජයන සමාජ වටපිටාවක් ගොඩනගා ගත හැකිය.
* රටේ ජීවත්වන සමස්ත ජනයාගේ අදහස්වලට ගරු කිරීම හේතුවෙන් ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු වේ.

*පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු විනිශ්චය කරන්න.*

*(ලකුණු 05 යි)*

5. (i) මහින්දාගමනය සිදු වූ ආකාරය සැකෙවින් දක්වන්න.
   (ii) ලක්දිව බුදුසමයේ ව්‍යාප්තියට දෙවනපෑතිස් රජතුමාගෙන් සිදු වූ මෙහෙය අගය කරන්න.
   (iii) මහින්දාගමනයෙන් අප ලැබූ දායාද පිළිබඳ විස්තරයක් කරන්න.

i. ධර්මාශෝක අධිරාජයාගේ ධර්මදූත සේවාවේ ප්‍රතිඵලයක් ලෙස සම්බුද්ධ පරිනිර්වාණයෙන් 236 වන වර්ෂයෙහි එනම් දෙවන පෑ තිස් රජතුමාගේ පළමු රාජ්‍ය වර්ෂයෙහි මහින්දාගමනය සිදුවිය. මිහිඳු මාහිමි ප්‍රමුඛ දූත පිරිස පොසොන් පුරපසළොස්වක් පොහෝ දින මිහින්තලේ අම්බස්ථල පර්වතයට වැඩම කොට ලක්දිව වැසියාට ධර්ම දේශනා කළහ.

*කෙටියෙන් පැහැදිලි කිරීමක් තිබේ නම් ලකුණු 02 ප්‍රදානය කරන්න.*
*(ලකුණු 02 යි)*

ii.
* ලක්දිව බුදු සමයේ ව්‍යාප්තිය සඳහා දෙවන පෑතිස් රජතුමාගෙන් අමිල මෙහෙයක් සිදුවිය.
* රජතුමා පළමුව බුදු දහම වැළඳගෙන රට වැසියන්ට ද බුදු දහම වැළඳ ගැනීම සඳහා ආදර්ශයක් සැපයීම
* මහමෙව්නා උයන සඟ සතුකොට පූජා කොට එහි විනය සීමාව පිහිටුවා මහා විහාරය ඉදිකොට සම්බුද්ධ ශාසනයේ පදනම දැමීම.
* අරිට්ඨ කුමාරයා ඇතුළු පිරිස ශාසනයට ඇතුළත් කොට භික්ෂු සමාජය ඇති කිරීමට කටයුතු කිරීම.
* අනුලා දේවිය ඇතුළු කාන්තාවන්ට පැවිදිවීම සඳහා සංඝමිත්තා තෙරණිය ගෙන්වා ගැනීමට කටයුතු සැලැස්වීම.
* ශ්‍රී මහා බෝධීන් වහන්සේ දඹදිව සිට මෙරටට ගෙන්වා ගනු ලැබීම.
* ලක්දිවට බුදු සසුන පැමිණීමෙන් පසු ඉදිකළ පළමු චෛත්‍යය වන ථූපාරාමය ගොඩනැංවීම.

PAST PAPERS WIKI

*කරුණු 03 ක් එත් ඇතුළත් පිළිතුරකට ලකුණු 03 ලබා දෙන්න.*
*(ලකුණු 03 යි)*

iii.

මිහිඳු මහ රහතන් වහන්සේ ප්‍රධාන ධර්මදූතයන් වහන්සේලාගේ සම්ප්‍රාප්තියත් සමගම ලංකා ශාසන ඉතිහාසයේ රන් අකුරින් ලියැවුණු සමාරම්භය සනිටුහන් විය. ශ්‍රී ලාංකේය ජනතාවට බුදු දහමේ ආශිර්වාදය ලැබුණි. එසේම ඒ දහමින් ඔප් නැංවුණු ශ්‍රේෂ්ඨ දායාද රාශියක් උරුම විය. ඒ අතර,

* මහා විහාරය කේන්ද්‍ර කොට ගත් වෙහෙර විහාර ඇති වීම
* භික්ෂු සමාජය හා භික්ෂුණී සමාජය ඇති වීම
* මහා විහාරය කේන්ද්‍ර කොට ගත් අධ්‍යාපන ක්‍රියාවලියක් ආරම්භ වීම
* ශ්‍රී මහා බෝධීන් වහන්සේ වැඩමවා රෝපණය කිරීම
* ප්‍රතිමා කලාව හා වාස්තු විද්‍යාත්මක නිර්මාණ බිහි වීම
* චිත්‍ර, මූර්ති, කැටයම් ගෘහ නිර්මාණ ආදී කලා අංග බිහිවීම
* භාෂාව හා අක්ෂර මාලාවක් ලැබීම
* සිංහල හා පාලි ගද්‍ය පද්‍ය සාහිත්‍යයක් ලැබීම
* දැහැමි රාජ්‍ය පාලන ක්‍රමයක් ඇති වීම
* දැහැමි ආර්ථික ප්‍රතිපත්තියක් ලැබීම
* දැහැමි පුද, සිරිත් ඇති වීම
* උසස් සාරධර්ම හා ගුණ ධර්ම ලැබීම

*පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු පිරිනමන්න.*

*(ලකුණු 05 යි)*

6. (i) දෙවන ධර්ම සංගායනාව පැවැත්වීමට තුඩුදුන් හේතු සැකෙවින් දක්වන්න.
   (ii) එම ධර්ම සංගායනාව පැවැත් වූ ස්ථානය, රාජානුග්‍රහය ලබා දුන් පාලකයා හා සහභාගි වූ භික්ෂූන් ගණන ලියන්න.
   (iii) දෙවන ධර්ම සංගායනාවේ ප්‍රතිඵල ගෙනහැර දක්වන්න.

i. දෙවන ධර්ම සංගායනාව පැවැත්වීමට තුඩුදුන් හේතුව වන්නේ විශාලා මහනුවර වැසි වජ්ජිපුත්තක භික්ෂූන් දස වස්තුවක් ඉදිරිපත් කිරීමයි. අකැප වූ කරුණු දහයක් කැප යයි එම භික්ෂූහු ප්‍රකාශ කොට ක්‍රියාවට නැංවූහ. මෙය විනිශ්චය කිරීමේ අවශ්‍යතාවක් ඇති විය. එසේම ධර්ම විනය පිරිසිදුව පවත්වාගෙන යාමේ අවශ්‍යතාව ද ඇති විය.

*(ලකුණු 02 යි)*

ii. විශාලා මහනුවර වාලුකාරාමයේදී/ විශාලා මහනුවරදී/ වාලුකාරාමයේදී

කාලාශෝක රජතුමා

හත් සියයයි/ 700

PAST PAPERS WIKI

*(ලකුණු 03 යි)*

iii. දෙවන ධර්ම සංගායනාවේ ප්‍රතිඵල සමූහයක් වූ අතර ඒවා ශාසන ඉතිහාසය කෙරෙහි බල පෑ ආකාරය ශාසන ඉතිහාසය තුළින් ප්‍රකට වේ.

* දස වස්තුව අකැප යැයි ප්‍රතික්ෂේප වීම.
* විනය විරෝධීව කටයුතු කළ භික්ෂූන්ට නිග්‍රහ කිරීම
* පළමුවන ධර්ම සංගායනාවේදී ඇති කර ගත් සම්මුතිය අනුව ශික්ෂාපද ලිහිල් නොකොට ඉදිරියට පවත්වාගෙන යාමට තීරණය කිරීම.
* මෙහෙක් පැවති ථේරවාදී භික්ෂු පරපුර ථේරවාද හා මහාසංඝික ලෙස බෙදී පසුව අටළොස් නිකායක් බවට සංවර්ධනය වීම
* දස වස්තුව පිළිගත් දුර්මතධාරී වජ්ජිපුත්තක භික්ෂූන් දස දහසක් සසුනින් ඉවත් කර සංඝ සංශෝධනයක් සිදු කිරීම

ආදී කරුණු තුනක් වත් ඇතුළත් වන සේ විස්තර කර ඇත් නම් ලකුණු 05 ක් ලබා දෙන්න.

(ලකුණු 05 යි)

7. පහත සඳහන් මාතෘකා අතුරෙන් දෙකකට කෙටි සටහන් ලියන්න.

(i) ථේරුකානේ චන්දවිමල මහනාහිමි
(ii) කල්‍යාණ මිත්තතා
(iii) සද්ධර්ම රත්නාවලිය
(iv) බුදුපිළිමය

i. <u>ථේරුකානේ චන්දවිමල මහ නාහිමි</u>

රයිගම් කෝරළයේ ථේරුකාන ගමෙහි උපත ලද රූබෙල් ගුණවර්ධන කුමරු බුරුම ජාතික යූ. විනයාලංකාර හිමියන් වෙතින් ථේරුකානේ චන්දවිමල නමින් පැවිදි විය. පසුව බුරුම රටට වැඩම කොට ත්‍රිපිටකය හා බුරුම භාෂාවත් මනාව ඉගෙන ගෙන එහිදී ම උපසම්පදාව ලබා පසු කලකදී ලංකාවට වැඩම කළේය.

ඉතා චාම්, අල්පේච්ඡ ජීවිතයක් ගත කළ උන්වහන්සේ ඉතා නිහතමානීව දිවි ගෙවූ බව ප්‍රකට ය.

බෞද්ධයාගේ දහම් දැනුම වර්ධනය කිරීම සඳහා ග්‍රන්ථ රැසක් ම උන්වහන්සේ අතින් රචනා විය. පාරමිතා ප්‍රකරණය, පොහොය දිනය, ධර්ම විනිශ්චය යන ග්‍රන්ථ ඉන් කිහිපයකි.

1997 ජූලි 04 වන දින අපවත් වූ උන්වහන්සේගේ අදාහන කටයුතු ද ඉතා චාම් ආකාරයට සිදු කෙරිණි.

*පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු පිරිනමන්න.*

PAST PAPERS WIKI

(ලකුණු 05 යි)

ii. <u>කල්‍යාණ මිත්තතා</u>

කල්‍යාණ මිත්තතා යනු යහපත් මිත්‍රයන් ඇසුරු කිරීමයි. මෙහිදී සැළකිලිමත් විය යුත්තේ මිත්‍රයාගේ වයස හෝ තරාතිරම නොව ගතිගුණ කෙරෙහිය. ඔවුන් සතු සද්ධා, සීල, චාග, පඤ්ඤා යන ගුණ ධර්ම තම ජීවිතයට සමීප කර ගැනීම කල්‍යාණ මිත්‍රයන්ගේ ආශ්‍රය තුළින් අපේක්ෂා කර ගත යුතු ප්‍රමුඛ කරුණයි.

*පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු පිරිනමන්න.*

(ලකුණු 05 යි)

iii. <u>සද්ධර්ම රත්නාවලිය</u>

"සද්ධර්මය නමැති මිණිකැට ඇමිණූ මාලය" යන අරුත ගෙන දෙන සද්ධර්ම රත්නාවලිය කෘතිය ධර්මසේන නම් හිමි නමකගේ නිර්මාණයකි. දඹදෙණි සාහිත්‍ය යුගයේදී මෙම ග්‍රන්ථය රචනා කොට ඇත. ධම්මපදයට ලියූ අටුවාව වන පාලි ධම්මපදට්ඨකථාව ඇසුරින් මෙම ග්‍රන්ථය සම්පාදනය කර ඇතත් එහි පදානුගත පරිවර්තනයක් නොවන බව ප්‍රකටය. ගැමි වහරට සමීප වූ උපමා උපමේයයන් බහුලව යොදා ගනිමින් පොදු බෞද්ධ මහජනයාගේ යහපත උදෙසා මෙම ග්‍රන්ථය සම්පාදනය කර ඇත. ඉන් ගැමි ජීවිතයේ සුවඳ වහනය වේ.

පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු පිරිනමන්න.

(ලකුණු 05 යි)

iv. <u>බුදු පිළිමය</u>

බුද්ධ ප්‍රතිමාව ක්‍රි.පූ පළමුවන සියවසේ කණිෂ්ක රාජ්‍ය සමයේදී නිර්මාණය වී ඇතැයි සැලකේ. ග්‍රීක රෝම කලාවේ ආභාසය ලබා ගන්ධාරයේදී බුද්ධ ප්‍රතිමා නිර්මාණය කර ඇති බව විශාරදයින්ගේ මතයයි. හිටි පිළිම, හිඳි පිළිම, සැතපෙන පිළිම හෙවත් ඕත් පිළිම වශයෙන් පිළිම වර්ග තුනක් වේ. ත්‍රිවිධ චෛත්‍යය අතුරින් තුන් වැන්න බුද්ධ ප්‍රතිමාව වේ. බුදු පිළිමයේ පසු කාලීන සංවර්ධනයේදී විවිධ මුද්‍රා හා ආසන නිර්මාණය විය

*පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු පිරිනමන්න.*

(ලකුණු 05 යි)

PAST PAPERS WIKI